# කටුවන ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජුලි 31 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිළි කිරීම් අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 39 ක් සඳහා ලැබියයුතු ප්‍රාග්ධන ලැබීම් රු. 20,339,183 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී බිල්පත් ඉදිරිපත් කර තිබුණද ගෙවීම් සිදු නොකළ කර්මාන්ත 50 ක් සඳහා ගෙවිය යුතු රු. 29,198,156 ක මුදල වර්ෂය අවසානයේදී ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

---

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා සභාවට ලැබී තිබුණ රු. 180,000 ක ආයුර්වේද බෙහෙත් තොගයේ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) අංක 227-5870 දරන වෑන් රථය 2012 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී කුලියට දීම වෙනුවෙන් වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු. 106,205 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) මගනැගුම වැඩසටහන යටතේ 2010 හා 2011 වර්ෂයන්හි ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු. 91,295,179 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස 3/81 ආදායම් විෂයයට බැරකර තිබුණි.

(ඊ) සභාවේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දිම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු. 588,552 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2012 වර්ෂයේ අවසානයට සභාවට අයත් කඩකාමර 06 කින් අයවිය යුතුව තිබූ එකතුව රු. 351,167 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2010 හා 2011 වර්ෂයන්හි මගනැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත වෙනුවෙන් ගෙවා තිබුණ රු. 91,245,724 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ප්‍රාග්ධන වියදම් 309 වැය විෂයයට හරකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයතුල මිළටගෙන තිබුණු රු. 3,139,104 ක ස්ථාවර වත්කම්වල වටිනාකම අදාල වත්කම් ගිණුම් හරකර ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම බැරකර නොතිබුණි.

(ඒ) රු. 414,452 ක් වටිනා ජල උපකරණ වර්ග 28 කට අදාල ඒකක 564 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු අතර වටිනාකම දක්වා නොතිබූ ජල උපකරණ වර්ග 78 කට අදාල ඒකක 3166 ක වටිනාකමද ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

එකතුව රු. 18,473,571 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාල ලිඛිත සාක්ෂි හා විස්තර ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,167,843 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 939,142 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | | 000' | 000' | 000' |
| (i) | වරිපනම් හා බදු | 35 | 23 | 01 |
| (ii) | බදුකුලී | 13,515 | 9,738 | 818 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,182 | 1,281 | 07 |
| (iv) | වෙනත් ආදායම් | 30,775 | 31,014 | 10,986 |

#### 2.2.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙහි සඳහන් විධි විධාන ප්‍රකාර සභාව විසින් වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

#### 2.2.3 බදුකුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් මිද්දෙනිය, කටුවන , කිරම , කරමැටිය , වරාපිටිය , උඩගොමඩිය සහ අළුපොත්දෙනිය යන පොදු වෙළඳ පලවල් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 අනුව ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කාමර කුලී මුදල රු. 818,065 ක් වූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. 2013 ජුලි 19 දිනට හිඟ කුලී මුදලින් රු. 149,675 ක් අයකර තිබුණි.

### 2.2.4 ජල ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ආදායම රු. 4,737,232 ක් වූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම මුදලින් රු. 1,420,013 ක් 2013 ජුලි 19 දින වන විට අයකර ගෙන ඇති බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු. 2,019,873 ක් හා මුද්දර ගාස්තු වශයෙන් රු. 3,732,081 ක් ලැබිය යුතුව තිබුණි. මෙම මුදලින් පිළිවෙලින් රු. 516,340 ක් හා රු. 2,699,540 ක් 2013 ජුලි 19 දිනට අයවී තිබු බව සභාපතිවරයා විසින් මාවෙත දන්වා තිබුණි.

### 2.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

සභාව සතු ට්‍රැක්ටර් රථ 02 ක් ඉතා දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය වූ අතර එම වත්කම් 2003 ජනවාරි 03 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 අවිධිමත් ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (1) වගන්තිය ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් වරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා නොගෙන ආදේශක සෞඛ්‍ය කම්කරුවන් 11 ක් සඳහා පත්වීම් ලබාදී රු. 806,778 ක මුදලක්ද , ආදේශක මාර්ග කම්කරුවන් 04 ක් සඳහා පත්වීම් ලබාදී රු. 417,609 ක මුදලක්ද , කැබ් රථ රියදුරු ලෙස පත්වීමක් ලබාදී රු. 37,794 ක මුදලක්ද වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) දිස්ත්‍රික් සාහිත්‍ය උත්සවය 2012 ඔක්තෝබර් 09 දින පැවැත්වූ බවත් ඒ සඳහා දරන ලද දේශන ගාස්තු , ප්‍රවාහන හා නවාතැන් ගාස්තු වෙනුවෙන් රු. 25,000 ක මුදලක් වැයකළ බවත් දක්වමින් සභාවේ සභිකයෙකු විසින් කර තිබූ ඉල්ලීමක් අනුව 2012 ඔක්තෝබර් 17 දින රු. 25,000 ක මුදලක් එකී සභිකයා වෙත ගෙවා තිබුණි.

i. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය මේ සඳහා ලබාගෙන නොතිබුණි.

ii. රු. 25,000 ක මුදල වැයකර ඇති ආකාරය සනාථ කිරීම සඳහා අවශ්‍ය බිල්පත්‍ර ගෙවීම් වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අංක 252-6508 දරන කැබ්රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2012 මැයි 24 දින රු. 2,112,564 ක් වැයකර තිබුණද 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 179 ප්‍රකාර කැබ්රථය අලුත්වැඩියා කල ආයතනය සමඟ ගිවිසුම්ගතව නොතිබුණි.

(ඈ) අංක 252 – 6508 කැබ්රථය සඳහා එලෝවීල් 04 ක් මිළදී ගැනීම වෙනුවෙන් 2012 අගෝස්තු 24 දින රු. 47,040 ක මුදලක් වැයකර තිබුණද ඒ සඳහා 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 177 හා 178 ප්‍රකාර මිළ ගණන් කැඳවා නොතිබුණි.

(ඉ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි තනතුරු වර්ගීකරණය සහ වැටුප් කාණ්ඩය පදනම් කර නොගෙන වැටුප් ගෙවීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සහායක ලෙස කටයුතු කරන සේවකයන් පස් දෙනෙකු සඳහා 2012 වර්ෂය තුළ එකතුව රු. 14,176 ක වැටුප් හා දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

වැටුප් වැඩිපුර ගෙවීම හේතුවෙන් සභාව විසින් ගෙවනු ලබන සියයට 12 ක අර්ථ සාධක අරමුදල් හා සියයට 3 ක සේවක භාරකාර අරමුදල්ද වැඩිපුර ගෙවීම් කර ඇති බවද නිරීක්ෂණය විය.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

2011 වර්ෂයේ මගනැගුම වැඩසටහන යටතේ සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත සඳහා උපදෙස් පරිදි මුරගල් යොදා මතුපිට කපරාරු කර සුදු හුණු ආලේප කිරීම වෙනුවෙන් එකතුව රු. 25,340 ක මුදලක් ගෙවා තිබුණද මුරගල් කපරාරු කර සුදු හුණු ආලේප කර නොතිබූ බව 2012 අගෝස්තු 11 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 61,156 ක ආපදා ණය හා උත්සව අත්තිකාරම් මුදල් 2013 ජුලි 19 වන දින දක්වාම අයකරගත නොහැකිවී තිබුණි.

(ආ) සභාවට ස්ථිරව පත්කර එවා තිබු නිලධාරීන් දෙදෙනෙකුගේ සහ සභාවේ ආදේශක තනතුරුවල සේවය කර ස්ථිර කරන ලද සේවකයින් 06 දෙනෙකුගේ වැටුප් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය වී නොතිබු අතර 2012 දෙසැම්බර් 31 දිනට එසේ ප්‍රතිපූර්ණය නොවූ මුදල රු. 969,280 ක් විය.

(ඇ) 2011 මාර්තු 14 දින කිරම නව වෙළඳපල විවෘත කිරීමේ උත්සව කටයුතු සඳහා 2011 මාර්තු 11 දින ගෙවන ලද රු. 20,000 ක අත්තිකාරම් මුදල 2013 මැයි 08 දින දක්වාම පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 04 කට අදාලව සේවකයින් 15 ක අතිරික්තයක් හා තනතුරු 09 කට අදාලව සේවකයින් 16 ක ඌණතාවයක් පැවතුනි.

03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වාහන පාලනය